**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2018**

---

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2017 ජූනි 29 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය (මාස දහඅටක කාල පරිච්ඡේදය) සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක. 0486-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II වාවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර පළාතේ පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතියක් ඉදි කිරීම මගින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමට සහාය ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතියක් ස්ථාපනය කිරීම නම් වූ සංරචකය යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 268.36 කට සමාන එජඩො මිලියන 1.8 ක් වන අතර එම මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය මගින් එහි කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය

මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශ මඟින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් මෙම විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | නිර්දේශය |
|---|---|---|---|---|
| ---------------- | -------------------- | -------- | ------------------ | ---------- |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින හෝ එයට පෙර විගණකාධිපතිතුමා වෙත | විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ | මෙය නව ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘතියට අදාළ ගිණුම්කරණ සහ පරිපාලන ක්‍රියාකාරකම් විධිමත් කිරීමට අදාළ | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව |

| | | | | |
|---|---|---|---|---|
| MOFP/ERD/2007/02 සහ 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛය | ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 13 වන දා විගණනයට ඉදිරිපත් කරන ලදී. | ප්‍රමාදය හේතුවෙන් පරිත්‍යාගශිලියාගේ අවශ්‍යතාව සපුරාලීමට නොහැකි විය. | ක්‍රියාකාරකම් 2018 වර්ෂය අවසානයේ දි ආරම්භ කරන ලදී. ඒ සඳහා ඇපකැප වූ කාර්ය මණ්ඩලයක් යෙදවීමට හැකි තත්ත්වයක් නොතිබුණි. පසුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හරින ලද අතර මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලබා ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්බන්ධ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය | බලපෑම | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්පත් කර ගත් ප්‍රගතිය | | | | |
| -------- | ------------ | ------------ | ------- | ------- | -------- | ---------------------- | ---------- |
| පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතියක් ස්ථාපනය කිරීම. | පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධති නියමු ව්‍යාපෘතිය සඳහා ලංසු/ මිලගණන් කැඳවීම. | ව්‍යාපෘති පාලන සංග්‍රහයට අනුව, 2018 1 වන කාර්තුවේ දී නිකුත් කිරිමට සැලසුම් කර ඇත. | 2018 නොවැම්බර් 07 දින ක්‍රියාත්මක කරන ලදී. (4 වන කාර්තුව ) | මාස 07 යි. | ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමේ දි සිදු විය හැකි ප්‍රමාද | උපදේශකයන් බඳවා ගැනීමේ කටයුතු 2016 4 වන කාර්තුවේ දි ආරම්භ කරන ලද අතර 2017 පළමු කාර්තුව ආරම්භය වන විට මූලික සැලසුම් කටයුතු සඳහා උපදේශකයයන් යෙදවීමට ලංකා විදුලි (පුද්ගලික) සමාගම සූදානම් ව සිටින ලදී. ණය මුදලේ සඵලදායිතාව ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වූ අතර ප්‍රධාන ව්‍යාපෘති ගිවිසුම අත්සන් තැබීම හේතුවෙන් 2017 වසරේ 03 වන කාර්තුවේ දී මෙය ක්‍රියාත්මක කළ හැකි විය. ව්‍යාපෘති සංකල්පයේ නවතාවය හේතුවෙන්, සැලසුම් කිරීමේ අදියර සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත කිරීමට සිදු විය. | ව්‍යාපෘති පාලන සංග්රහය / ව්‍යාපෘති සැලසුම අනුව, වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කොන්ත්‍රාත්තුව පිරි නැමීම | 2018 වසරේ 04 වන කාර්තුවේ දි කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නියමිතව තිබුණි. | 2020 පෙබරවාරි 11 වන දින පිරිනමන ලදී. | මාස 13 යි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමේ දි සිදු විය හැකි ප්‍රමාද | ටෙන්ඩර් භාර දීමේ අවසාන දිනය තෙවරක් දීර්ඝ කිරීම, තක්සේරු කිරීමේ කාලය දීර්ඝ කිරීම සහ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් නොමැති වීම ප්‍රමාදයට හේතු වූ සාධක වූ අතර එබැවින්, කොන්ත්‍රාත්තුව 2020 --- කාර්තුවේ දි පිරිනැමීමට හැකි විය. | ව්‍යාපෘති පාලන සංග්‍රහය / ව්‍යාපෘති සැලසුම අනුව, වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතිය සඳහා වැඩ සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දි ප්‍රමාදයක් සිදු වී තිබුණි. | තනි ටර්න්කී (turnkey) කොන්ත්‍රාත්කරුවකු විසින් සම්පූර්ණ සැලැස්ම, ප්‍රසම්පාදනය සහ සවිකිරීම් සිදු කරන ලදී. ව්‍යාපෘතියේ මුල් සහ අතුරු වැඩ සැලැස්ම සහ විය පැහැදම් ගෙවීමේ ලැයිස්තුව පිළියෙළ කර ඒවා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කළද, ඇති වූ ප්‍රමාදය හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලදී. ප්‍රතිශෝධිත සැලැස්ම සහ විය පැහැදම් ගෙවීමේ ලැයිස්තුව 2020 ජූනි 17 වන දා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී. මේ වන විට කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තබා ඇති අතර 2021 ජූනි මාසය වන විට මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. | අනුමත ව්‍යාපෘති වැඩ සැලැස්මකට අනුව කටයුතු කළ යුතුය. |